# බ්‍රිතාන්‍යයන් යටතේ ශ්‍රී ලංකාවේ දේශපාලන වෙනස්වීම්

## 11 ශ්‍රේණිය - ඉතිහාසය

## 04 පාඩම

වර්ෂ 1815 දී උඩරට රාජධානිය බ්‍රිතාන්‍යයන්ට යටත්වීමෙන් පසු 1948 වර්ෂයේ දී ශ්‍රී ලංකාවට නිදහස ලැබෙන තෙක් වසර 133 ක කාලය තුළ බ්‍රිතාන්‍යයන් විසින් වරින් වර ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණ කිහිපයක් මෙරටට හඳුන්වා දී ඇත.

### මෙම පාඩමේ අරමුණු

- බ්‍රිතාන්‍යයන් විසින් මෙරටට හඳුන්වා දුන් ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණ,
- ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණ ලබාගැනීම සඳහා පැවති උද්ඝෝෂණ,

යන කරුණු පිළිබඳ අධ්‍යයනය කිරීම.

### බ්‍රිතාන්‍යයන් විසින් මෙරටට හඳුන්වා දුන් ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණ,

| | | |
|---|---|---|
| 01 | කෝල්බෘක් ප්‍රතිසංස්කරණ, | වර්ෂ 1833 |
| 02 | කෲව් - මැකලම් ප්‍රතිසංස්කරණ, | වර්ෂ 1910 |
| 03 | මැනිං ප්‍රතිසංස්කරණ, | වර්ෂ 1920 |
| 04 | මැනිං - ඩෙවොන්ෂයර් ප්‍රතිසංස්කරණ, | වර්ෂ 1924 |
| 05 | ඩොනමෝර් ප්‍රතිසංස්කරණ, | වර්ෂ 1931 |
| 06 | සෝල්බරි ප්‍රතිසංස්කරණ, | වර්ෂ 1947 |

### ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණවල විශේෂ ලක්ෂණ

<table>
<tr><th>ප්‍රතිසංස්කරණයේ නම</th><th>හඳුන්වා දුන් විශේෂ ලක්ෂණ</th></tr>
<tr><td>කෝල්බෘක් ප්‍රතිසංස්කරණ</td><td>01 ව්‍යවස්ථාදායක සහ විධායක සභා මෙරට පිහිටුවීම.
<table>
<tr><th>ව්‍යවස්ථාදායක සභාව</th><th>විධායක සභාව</th></tr>
<tr><td>• ආණ්ඩුකාරයාගේ අසීමිත බලය සීමා කිරීම,<br>• නීති සම්පාදනය කිරීම,<br>• නිලලත් සහ නිලනොලත් ලෙස කොටස් දෙකකින් සමන්විත වීම,<br>• නිලලත් - රජයේ උසස් නිළධාරීන්<br>• නිලනොලත් - වාර්ගික පදනම මත ආණුඩුකාරයා විසින් නම් කරන ලද නියෝජිතයී (වාර්ගික නියෝජනය)</td><td>• ආණ්ඩුකාරයාගේ මුදල් සහ පරිපාලන බලය සීමා කිරීම.<br>• රජයේ ඉහළ නිළධාරීන්ගෙන් සමන්විත වීම.<br>o යටත් විජිත ලේකම්<br>o භාණ්ඩාගාරික<br>o ගණකාධිකාරී<br>o මිණුම්පති<br>o රේගු අයකැමි</td></tr>
</table>
02 උඩරට සහ පහතරට ඒකාබද්ධ කර පාලනයක් පිහිටුවීම<br>03 දිවයින පළාත් 05 ට බෙදීම<br>04 අනිවාර්ය සේවා රාජකාරි ක්‍රමය අහෝසි කිරීම<br>05 රජයේ වෙළඳ ඒකාධිකාරය අහෝසි කිරීම</td></tr>
<tr><td></td><td>01 සීමිත ඡන්ද බලය හඳුන්වා දීම<br>02 ප්‍රථම වරට සීමිත ඡන්ද බලයෙන් නියෝජිතයින් පත්කිරීම<br>03 ප්‍රථම වරට උගත් ලාංකිකයෙකු ව්‍යවස්ථාදායක සභාවට තේරී පත්වීම</td></tr>
</table>

| | |
|---|---|
| කෲව්-මැකලම් ප්‍රතිසංස්කරණ, | |
| මැනිං ප්‍රතිසංස්කරණ, | 01 ව්‍යවස්ථාදායක සභාවේ මුල් වරට නිලනොලත් බහුතරයක් ඇතිවීම<br>02 පළාත්බද නියෝජන ක්‍රමය හඳුන්වා දීම<br>03 වාර්ගික නියෝජනය ක්‍රමය තවදුරටත් ක්‍රියාත්මක වීම |
| මැනිං - ඩෙවොන්ෂයර් ප්‍රතිසංස්කරණ | 01 මහජන ඡන්දයෙන් පත් වූ පිරි බහුතරය වීම<br>02 ආණ්ඩුව පවත්වාගෙන යාමේ වගකීම ආණ්ඩුකාරයාට පැවරුන ද ඔහුට බහුතර බලයක් නොවූ හෙයින් ආණ්ඩුවේ බලය මහජන නියෝජිතයින්ට හිමිවිය |
| ඩොනමෝර් ප්‍රතිසංස්කරණ, | 01 සර්වජන ඡන්ද බලය ප්‍රදානය කිරීම ( වාර්ගික නියෝජන ක්‍රමය අහෝසි කිරීම)<br>02 විධායක කාරකසභා පිහිටුවීම<br>03 ව්‍යවස්ථාදායක සභාව රාජ්‍ය මන්ත්‍රණ සභාව නමින් හැඳින්වීම<br>04 රාජ්‍ය මන්ත්‍රණ සභාවට රාජ්‍ය නිලධාරීන් 03 කු පත් කිරීම<br>නීති ලේකම්/ රාජ්‍ය ලේකම්/මුදල් ලේකම් |
| සෝල්බරි ප්‍රතිසංස්කරණ, | 01 ආණ්ඩුකාරයා වෙනුවට අග්‍රාණ්ඩුකාර ධූරය ඇති කිරීම.<br>02 පාර්ලිමේන්තුව මණ්ඩල 02 න් සමන්විත වීම.<br>▪ මහජන මන්ත්‍රී මණ්ඩලය<br>▪ සෙනෙට් සභාව<br>03 අගමැති ප්‍රධාන කැබිනට් මණ්ඩලයක් ඇති කිරීම.<br>04 රාජ්‍ය සේවා සහ අධිකරණ සේවා කොමිසන් සභා පිහිටුවීම. |

## <u>ව්‍යවස්ථාදායක සභාවේ විකාශනය</u>

| වර්ෂය | ප්‍රතිසංස්කරණයේ නම | සාමාජික සංඛ්‍යාව | නිලලත් | නිලනොලත් | ආණ්ඩුකාරයා පත්කළ | ඡන්දයෙන් පත්කළ |
|---|---|---|---|---|---|---|
| **1833** | කෝල්බෲක් ප්‍රතිසංස්කරණ | **15** | 09 | 06 | 06 | 00 |
| **1910** | කෲව්-මැකලම් ප්‍රතිසංස්කරණ | 21 | 11 | 10 | 06 | 04 |
| **1920** | මැනිං ප්‍රතිසංස්කරණ | 37 | 14 | 23 | 07 | 16 |
| **1924** | මැනිං-ඩෙවොන්ෂයර් ප්‍රතිසංස්කරණ | 49 | 12 | 37 | 08 | 29 |
| **1931** | ඩොනමෝර් ප්‍රතිසංස්කරණ (රාජ්‍ය මන්ත්‍රණ සභාව) | 61 | 03 | 00 | 08 | 50 |
| **1947** | සෝල්බරි ප්‍රතිසංස්කරණ (ද්විමණ්ඩල පාර්ලිමේන්තුව) | 101 | 00 | 00 | 06 | 95 |

## ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණ සඳහා උද්ඝෝෂණ

### ➢ යුරෝපීය උද්ඝෝෂණ

වර්ෂ 1833 දී මෙරටට හඳුන්වා දුන් කෝල්බෲක් ප්‍රතිසංස්කරණවල සංශෝධන කර ගැනීම සඳහා මුල්වරට උද්ඝෝෂණයක් ආරම්භ කරන ලද්දේ මෙරට සිටි යුරෝපීය ව්‍යාපාරිකයින් විසිනි.
එම උද්ඝෝෂණවල අරමුණ වූයේ

- o වතු වගාවට අවශ්‍ය යටිතල පහසුකම් සඳහා පහසුවෙන් මුදල් වෙන් කර ගැනීමට.
- o නිල නොලත් සංඛ්‍යාව ඉහළ නංවා ගැනීමට
- o නිල නොලත් පිරිස ආණ්ඩුකාරයා නම් නොකර ඡන්දයකින් පත්කර ගැනීම.

**මෙම අරමුණු දිනා ගැනීමට යොදා ගත් ක්‍රමවේද**

- o ව්‍යවස්ථායක සභාව තුළ ප්‍රශ්න ඇසීම.
- o යෝජනා ඉදිරිපත් කිරීම.
- o පුවත්පත්වලට ලිපි සැපයීම.
- o සංවිධාන පිහිටුවීම. (1865 දී ජෝර්ජ් වෝල්ගේ නායකතත්වයෙන් ලංකා සංගමය නම් සංවිධානයක් පිහිටුවා ගත්හ. එමගින්)

### ➢ ශ්‍රී ලාංකීය මධ්‍යම පාංතික උද්ඝෝණ

**මධ්‍යම පාංතික ප්‍රධාන ඉල්ලීම්**

- o ව්‍යවස්ථාදායක සභාවේ නිලනොලත් සාමාජික පිරිස ඉහළ දැමීම
- o වාර්ගික නියෝජන ක්‍රමය අහෝසි කිරීම
- o පළාත්බද නියෝජන ක්‍රමය අනුව ඡන්දයෙන් නියෝජිතයින් තෝරා ගැනීමට ඉඩ දීම
- o ව්‍යවස්ථාදායක සභාවේ බලතල වැඩි කිරීම

**මෙම අරමුණු දිනා ගැනීමට යොදා ගත් ක්‍රමවේද**

- o යටත් විජිත භාර ලේකම් වෙත පෙත්සම් ඉදිරිපත් කිරීම (මුල්ම පෙත්සම ජේම්ස් පීරිස් මහතා ( 1908)
- o සංවිධාන පිහිටුවා ගැනීම
  උදාඃ පහත රට නිෂ්පාදන සංගමය
  ශලාවත සංගමය
  යාපනය සංගමය

★ මෙම උද්ඝෝෂණවල ප්‍රතිඵලයක් ලෙස කෲව් - මැකලම් ප්‍රතිසංස්කරණ ලබා දෙන ලදි,

### ➢ අමද්‍යප ව්‍යාපාරය

- o රජය 1912 දී රා තැබෑරුම් පිහිටුවීමට අවසර දෙමින් නව සුරා බදු පනතක් පැනවීම නිසා අමද්‍යප ව්‍යාපාරය ආරම්භ විය.
- o ජාතික පුනරුද ව්‍යාපාරය තුළින් පැන නැගුණු අමද්‍යප ව්‍යාපාරයේ මූලික අරමුණ වූයේ
- o මධ්‍යසාර භාවිතයේ ආදීනව වටහාදීමයි.
- o නමුත් 1910 නව ප්‍රතිසංස්කරණ වලින් සෑහිමකට පත් නොවූ මධ්‍යම පාංතිකයින් නව සුරා බදු පනතට එරෙහි උද්ඝෝෂණ දේශපාලන නැඹුරුවක් සහිත ව්‍යාපාරයක් බවට පත්කර ගත්හ.

## පැවරුම 01

❖ **අමද්‍යප ව්‍යාපාරයේ කැපී පෙනෙන ලක්ෂණ සඳහන් කරන්න.**

ආගමික පුනරුදයේ ක්‍රියාකාරීන් සහ මධ්‍යම පාංතික ඉංග්‍රීසි උගතුන් අධිරාජ්‍යවාදීන් එරෙහිව එක අරමුණකින් කටයුතු තිරීම මෙම ව්‍යාපාරයේ ප්‍රධාන ලක්ෂණයකි,

1. ……
   ……
2. ……
   ……
3. ……
   ……

## වර්ෂ 1915 සිංහල මුස්ලිම් කෝලාහලය

……
……
……
……
……
……
……
……

## බ්‍රිතාන්‍යයන්ට එරෙහි ලාංකික උද්ඝෝෂණවල දී ඉන්දීය ජාතික ව්‍යාපාරයෙන් ලද ආභාසය

……
……
……
……
……
……
……
……
……
……
……

## ලංකා ජාතික සංගමය පිහිටුවීම

........................................................................................................................

........................................................................................................................

........................................................................................................................

........................................................................................................................

........................................................................................................................

........................................................................................................................

........................................................................................................................

........................................................................................................................

- ## නිදහස සඳහා උද්ඝෝෂණ

❖ ඩොනමෝර් ආණ්ඩුක්‍රමය යටතේ ලාංකිකයන්ට යම් බලයක් ලැබී තිබුන ද ආණ්ඩුකාරයා සහ රාජ්‍ය නිළධාරීන් තව දුරටත් බලතල අතැතිව සිටි නිසා එය සීමා කොට ලාංකික ඇමතිවරුන්ට බලය පැවරීම අවශ්‍ය බවට උද්ඝෝෂණයක් ආරම්භ විය.

- ## සූරිය මල් ව්‍යාපාරය

ඉහත උද්ඝෝෂණවලට අමතරව මෙරට වාමාංශිකයන් විසින් නිදහස ලබා ගැනීම සඳහා ගෙන ගියඋද්ඝෝෂණවල ප්‍රචාරක ව්‍යාපාරයක් ලෙස සූරිය මල් ව්‍යාපාරය හැඳින්වේ.

........................................................................................................

........................................................................................................

........................................................................................................

........................................................................................................

........................................................................................................

........................................................................................................

........................................................................................................

........................................................................................................

නිමාලි දේශාන්ත